# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
## காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
## LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


මගේ අංක / எனது இல / MY NO: 4/1/චක්‍රලේඛ
ඔබේ අංක / உமது இ இல / YOUR NO:
දිනය / திகதி / DATE: 2015.12.30

චක්‍රලේඛ අංක 2015/07

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්
නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්) වෙත.

**<u>විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබා දීම.</u>**

1. හැඳින්වීම.

රජය විසින් සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශිය හා දේශිය සෘජු ආයෝජන දිරිගැන්වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර එවැනි ව්‍යාපෘති සඳහා සුදුසු රජයේ ඉඩම් හඳුනාගෙන ඒවා ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් නිරන්තරයෙන් ඉදිරිපත් වේ. පවත්නා නිති රිති රාමුවට අනුකූලව සකස්ව ඇති ක්‍රියාපටිපාටි අනුව එසේ ඉඩම් ලබා දීමේදී පවත්නා අකාර්යක්ෂමතාවයන් සහ විශේෂයෙන්ම එම ක්‍රියාවලිය සඳහා අධික කාලයක් ගතවීම පිළිබඳව අයෝජකයන් විසින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ රජයේ විශේෂ අවධානය යොමු වී ඇත. සංවර්ධනයට බලපාන විශේෂ ආයෝජන ව්‍යාපෘති වලට ඉඩම් ලබා දීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම හා වේගවත් කිරිමේ අපේක්ෂාවෙන් පැවති ක්‍රියාපටිපාටිය සංශෝධනය කරමින් නව ක්‍රියාවලියක් මගේ අංක 2012/06 හා 2012.10.18 දිනැති චක්‍රලේඛය මඟින් හඳුන්වා දී තිබිණි. එම ක්‍රියාවලිය තව දුරටත් වැඩි දියුණු කරමින් වඩාත් කාර්යක්ෂම ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. ඒ අනුව මෙම චක්‍රලේඛය බලපවත්වන දින සිට මගේ අංක 2012/06 දරණ චක්‍රලේඛය මෙමඟින් සම්පූර්ණයෙන්ම සංශෝධනය වූ සේ සැලකිය යුතුය.

2. විශේෂ ආයෝජන ව්‍යාපෘති

මෙම චක්‍රලේඛය මඟින් ආවරණය වනු ලබන විශේෂ ආයෝජන ව්‍යාපෘති යනුවෙන් අදහස් වන්නේ පහත සඳහන් සනයේ ආයෝජන ව්‍යාපෘති වේ.

I. අමාත්‍ය මණ්ඩලය විසින් හෝ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් මඟින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් මේ සඳහා පත් කරන ලද විශේෂිත කමිටුවක් මඟින් හෝ අනුමැතිය ලබා දෙන ලද ආයෝජන ව්‍යාපෘති.
II. ආයෝජන මණ්ඩලය විසින් ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ අනුමැතිය ලබා දෙන ලද ආයෝජන ව්‍යාපෘති හෝ එම අනුමැතිය ලබා දීමේ අපේක්ෂාවෙන් යම් ඉඩමක් ලබා දීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් නිර්දේශය ලබා දෙන ලද ආයෝජන ව්‍යාපෘති.
III. කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිර්දේශ කරනු ලබන එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්ත කලාප හෝ කර්මාන්තපුරවල ආයෝජන ව්‍යාපෘති.
IV. සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අනුමත කරනු ලබන කුඩා පරිමාණ විදුලිය උත්පාදන ව්‍යාපෘති.

03. විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබා දෙනු ලබන ක්‍රම :-

අයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දෙනු ලබන්නේ 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන යටතේයි. එසේ ඉඩම් ලබාදීමේ ක්‍රමවේද දෙකක් ඇත. එනම්,

අ). දීර්ඝකාලින බදු ක්‍රමයට ලබා දීම.
ආ). දීමනා පත්‍රයක් මගින් පූර්ණ අයිතිය ලබාදීම.

දීර්ඝ කාලින බදු ක්‍රමයට ලබා දීමේදී පවත්න ප්‍රතිපත්ති හා රෙගුලාසිවලට අනුකූලව ආයෝජන ව්‍යාපෘතියේ ස්වභාවය හා වටිනාකම අනුව වසර 30 සිට වසර 99 දක්වා කාල සීමාවන් සඳහා බදුකර නිකුත් කෙරේ. එහිදී බදු අය කිරිම පිලිබඳව පනතේ විධිවිධාන රෙගුලාසි හා චක්‍රලේඛ මගින් පනවා ඇති විධිවිධාන හා අමාත්‍යා මණ්ඩලය විසින් අනුමත කර ඇති පවත්නා ප්‍රතිපත්ති අදාල වේ.

පූර්ණ අයිතිය සහිත දීමනාපත්‍රයක් මත ඉඩම් ලබා දිය හැක්කේ පනතේ ප්‍රතිපාදන අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ලිඛිත අනුමැතිය සහිතව පමණි. එහෙත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය තුලින් ද එවැනි ඉල්ලීම් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබේ.

දීමනාපත්‍ර මගින් ඉඩම් ලබා දීමේදී ද පවත්නා නිතිරිති, රෙගුලාසි හා ප්‍රතිපත්ති අනුව වටිනාකම අය කරනු ලැබේ.

04. විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා රජයේ ඉඩමක් බැහැර කිරිමේ සංශෝධිත ක්‍රියාවලිය :-

පහත සඳහන් වැඩ පියවර හා ඊට අනුෂාංගික කරුණු දීර්ඝ කාලින බදු ක්‍රමයට සහ පූර්ණ අයිතිය සහිත දිමනාපත්‍රයක් මගින් මෙම චක්‍රලේඛය මගින් ආවරණය වන විශේෂ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීමේදී අදාල කර ගත යුතුයි.

මෙම ක්‍රියාවලිය තුළ එක් එක් වැඩ පියවර සඳහා ගත කළ යුතු උපරිම කාලය මාර්ගෝපදේශයක් ලෙස සඳහන් කර ඇත. යම් අති විශේෂ හේතුවක් මත මිස මෙම කාලය ඉක්මවා යාම වළක්වා ගැනිමට අදාල ආයතනවල නිලධාරීන් විශේෂයෙන් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරමී.

මෙහි සඳහන් නිර්දේශ ලබා ගැනිම වැනි යම් කාර්යයක් නිශ්චිත අපේක්ෂිත කාලය තුල එම කාර්යය ඉටු කිරිම සඳහා ප්‍රතිචාරයක් නොදක්වන්නේ නම් අනවශ්‍ය ප්‍රමාදය වළක්වා ගැනිම සඳහා අදාල එකඟතාවය ලැබූ සේ සලකා ඊළඟ පියවර අනුගමනය කරනු ලැබේ

රජයේ ඉඩම් තොරතුරු කලමණාකරණ පද්ධතිය (e-slims) ක්‍රියාත්මක වන ප්‍රදේශිය ලේකම් කාර්යාලවලින් ක්‍රියා කිරීමේ දී එම වැඩසටහනට අදාල ක්‍රියාවලිය අනුගමනය කරමින් මෙම වැඩ පියවර ඊට සුදුසු පරිදි අදාල කර ගත යුතු බව ද සැලකිය යුතුයි.

| වැඩ පියවර | කාර්යය | කාර්යය පැවරුනු නිලධාරියා/ආයතනය | අපේක්ෂිත උපරිම කාලය | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| පියවර 01 | ආයෝජක විසින් ඉල්ලීමක් ඉඩම් කොමසාරිස් ජනරාල් (ඉ.කො.ජ) වෙත ඉදිරිපත් කිරීම. | ඉල්ලුම්කරු | - | ඉල්ලීම සමඟ පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.<br>I. ව්‍යාපෘති වර්තාව<br>II. ව්‍යාපෘතිය සඳහා ලබාදුන් අනුමත ලිපියේ පිටපතක්<br>III. ආයතනයක් නම් එහි ලියාපදිංචියට අදාල ලියවිලි පිටපත් |
| පියවර 02 | ඉල්ලීම ප්‍රාදේශිය ලේකම් (ප්‍රා.ලේ) වෙත යැවීම. | ඉඩම් කොමසාරිස් ජනරාල් | දින 01 | උපදෙස් ලිපියක් හා ඉල්ලීම සමඟ අදාල අනෙකුත් ඇමුනුම් ලියවිලි යැවිය යුතුය. |
| පියවර 03 | නිර්දේශ වාර්තා ලබාදිය යුතු ආයතනවල නිලධාරින්ගෙන් සමන්විත කමිටුව රැස්කර ඒකාබද්ධ ක්ෂේත්‍ර පරික්ෂණයක් පැවැත්වීම. | ප්‍රාදේශිය ලේකම් | සති 01 | මෙම කමිටුව පිළිබඳ විස්තර හා එහි කාර්යභාරය අංක 5 ඡේදයේ දක්වා ඇත. |
| පියවර 04 | අදාල ආයතනවල නිර්දේශ වාර්තා ලබා ගැනීම.<br><br>ඉඩමේ දළ අනුරේඛනයක් ලබාගැනිම. | ප්‍රාදේශිය ලේකම් | සති 01 | පළාත් සභාවේ එකඟතාවය හැර අනෙකුත් ආයතනවල අදාල නිර්දේශයන් හා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නියෝජිත විසින් ලබා දෙන ලබන දළ අනුරේඛනයක් ලබා ගත යුතුයි.<br><br>e-slims වැඩසටහන ක්‍රියාත්මක වේ නම් ඉඩම් නිලධාරී/ජනපද නිලධාරි විසින් අදාල තොරතුරු එහි ක්‍රියා පටිපාටිය අනුව ලබාගෙන දත්ත පද්ධතියට ඇතුලත් කළ යුතුයි. |
| පියවර 05 | ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ සහිත වාර්තාව අදාල අනෙකුත් ලියවිලි සමඟ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත එවීම. | ප්‍රාදේශිය ලේකම් | දින 03 | ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ සමඟ එවිය යුතු අනෙකුත් ලියවිලි පිළිබඳ විස්තර මෙහි 6 වන ඡේදයේ සඳහන් කර ඇත. ඉඩම |

| | | | | |
|---|---|---|---|---|
| | එම වාර්තාවේ සම්පූර්ණ පිටපතක් පළාත් ඉඩම් කොමසාරිස්ට (ප.ඉ.කො.ට) යැවීම. (පළාත් සභාවේ එකඟත්වය ඉඩම් කොමසාරිස් ජනරාල්ට ලබා දෙන ලෙස ඉල්ලමින්)<br><br>දළ අනුරේඛනය මත ඉඩම තක්සේරු කිරිමට තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීම. | | | තක්සේරු කිරීමට යොමු කිරීමේදී දළ අනුරේඛනය සහ ව්‍යාපෘතිය අනුමත කළ ලිපියේ පිටපතක් යොමු කළ යුතුය. තක්සේරු වාර්තාව ප්‍රාදේශිය ලේකම් වෙත ලබාගත යුතුය. e-slims වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රාදේශිය ලේකම් කාර්යාල එම වැඩසටහනේ වැඩ පියවර අනුගමනය කළ යුතුය. |
| පියවර 06 | පළාත් සභාවේ එකඟතාවය ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත එවීම. | පළාත් ඉඩම් කොමසාරිස් | සති 02 | |
| පියවර 07 | ඉඩම මැන නැත්නම් මැන, රේඛා චිත්‍රයක් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත එවිම සඳහා මැනුම් නියෝගයක් යැවිම | ප්‍රාදේශිය ලේකම් | දින 02 | මැනුම් නියෝගය සමඟ දළ අනු රේඛනයේ සහ ව්‍යාපෘතිය අනුමත කිරීමේ ලිපියේ පිටපත් යැවිය යුතුයි. |
| පියවර 08 | ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉදිරිපත් වූ නිර්දේශ වාර්තා විශේෂ ආයෝජන ව්‍යාපෘති ඒකකයේ ලියාපදිංචි කර ගැනීම.<br><br>පළාත් සභාවේ එකඟතාවය ලබාගැනීම.<br><br>ඉඩම් අමාත්‍යංශය වෙත නිර්දේශ ලිපිය සකස් කර ගොනුව සමඟ ඉදිරිපත් කිරීම. | ඉඩම් කොමසාරිස් ජනරාල් | දින 03 | මේ වන විට පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය ලැබී නැත්තම් ඉදිරියේදී ලැබීමට යටත්ව අමාත්‍යාංශයට ගොනුව ඉදිරිපත් කළ යුතුයි.<br><br>e-slims වැඩසටහන ක්‍රියාත්මක නොවන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට අදාල ව්‍යාපෘතියක් නම් මෙම ඒකකය මඟින් එම වැඩසටහනට දත්ත හා ලියවිලි ඇතුලත් කර ඉදිරි කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| පියවර 09 | ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් ගරු ඉඩම් අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ගොනුව ද සමග ඒ බව දන්වා එවීම. | ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් | සති 01 | මෙම විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා අනුමැතිය දීම සඳහා ඉඩම් අමාත්‍යාංශයේ ප්‍රමුඛතා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.<br><br>අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා දීමේදී ගැසට් නිවේදන පළ නොකිරීමට යටත්ව අනුමැතිය ලබා දෙනු ලැබේ. |
| පියවර 10 | ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබූ බව සහ ඉදිරියට ගත යුතු පියවර පිළිබඳ උපදෙස් ඇතුලත් ලිපියක් පළාත් ඉඩම් කොමසාරිස්ට සහ අයදුම්කරුට පිටපත් සහිතව ප්‍රාදේශිය ලේකම්ට යැවීම. | ඉඩම් කොමසාරිස් ජනරාල් | දින 02 | බදු අයකිරීම , ඉඩමේ භුක්තිය භාර දීම හා බදු ගිවිසුම සකස් කිරීමට අදාල උපදෙස් මෙම ලිපියේ අඩංගු විය යුතුයි. |
| පියවර 11 | තක්සේරු වාර්තාව ලබා ගැනීම. බදු තක්සේරු කිරීම හා මූලික අවස්ථාවේ අය කළ යුතු බදු/තක්සේරු වටිනාකම අය කර ගැනීම.<br><br>ඉඩමේ භුක්තිය භාර දීම (ඉඩම් කොමසාරිස් ජනරාල්ට පිටපතක් යොමු කිරීම)<br><br>බදු/තක්සේරු වටිනාකම ගෙවූ බවට ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දැන්වීම. | ප්‍රාදේශිය ලේකම් | සති 01 | |
| පියවර 12 | රේඛා චිත්‍රය ලබා ගැනීම. බදු ගිවිසුම/දීමනා පත්‍රය සකස් කිරීම.<br><br>දීමනාපත්‍රකරු/බදුකරු ගෙන්වා ගිවිසුම/දීමනා පත්‍රයඅත්සන් කරවා ගැනීම.<br><br>බදු ගිවිසුම/දීමනා පත්‍රය ජනාධිපති ලේකම් වෙත යැවීම. | ඉඩම් කොමසාරිස් ජනරාල් | සති 01 | |
| පියවර 13 | අත්සන් කරන ලද බදු ගිවිසුම/දීමනාපත්‍රය සෘජුව ලබා ගැනීම.<br><br>එය ලියාපදිංචි කිරීම සඳහා සෘජුව අදාල ඉඩම් රෙජිස්ට්‍රාර්ට යැවීම.(ලියාපදිංචි කර අදාල | ඉඩම් කොමසාරිස් ජනරාල් | දින 03 | බදු ගිවිසුම ලියාපදිංචි කිරීමට ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යවන ආවරණ ලිපියේ පිටපත් පළාත් ඉඩම් කොමසාරිස්ට සහ ප්‍රාදේශිය ලේකම්ට |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රාදේශීය ලේකම්ට යොමු කරන ලෙස දන්වා) | | | යොමු කළ යුතුයි. |
| පියවර 14 | ලියාපදිංචි කළ බදු ගිවිසුම/දීමනා පත්‍රය ලබා ගැනීම.<br>බදු ගිවිසුම/දීමනා පත්‍රය බදුකරුට/දීමනාපත්‍රකරුට විධිමත්ව භාරදීම<br>එසේ භාර දුන් බවට ඉඩම් කොමසාරිස් ජනරාල්ට සහ පළාත් ඉඩම් කොමසාරිස්ට වාර්තා කිරීම | ප්‍රාදේශීය ලේකම් | සති 01 | |

05. නිර්දේශ වාර්තා ලබාගැනීම :-

විශේෂ ආයෝජන ව්‍යාපෘති සඳහා දීර්ඝකාලීන බදු ක්‍රමයට හෝ දීමනාපත්‍රයක් මත හෝ රජයේ ඉඩමක් ලබා දීමේදී ඊට සම්බන්ධිත විවිධ ආයතනවල නිර්දේශ ලබාගැනීමත් අදාල පළාත් සභාවේ එකඟතාවය ලබාගැනීමත් (අන්තර් පළාත් බල ප්‍රදේශවල නම් අදාල නියෝජ්‍ය/සහකාර ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය අදාල වේ.) මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරියකු මඟින් ඉඩම් දළ අනුරේඛනයක් ලබාගැනීමත් එම ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් සේ ක්‍රියාකරමින් එකවර ක්‍රියාකල යුතුයි. ඒතුළින් අනවශ්‍ය ප්‍රමාදය වලක්වා ගැනීම හා ආයතන අතර විසඳගත යුතු ගැටළු සාකච්ඡා කර විසඳා ගැනීමත් අපේක්ෂා කෙරේ.

මෙම කමිටුවේ සම්බන්ධිකරණය අදාල ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කළ යුතු අතර එම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ඔහුගේ සුදුසු නියෝජිතයකු යොදා ගත හැක. මෙම කමිටුව ස්ථිර වශයෙන්ම ඇතුලත් විය යුතු ආයතනවල නිලධාරීන්ගෙන් ද ව්‍යාපෘතියේ ස්වභාවය හා ඉඩමේ පිහිටීම අනුව එක් එක් ව්‍යාපෘතියට අදාල වන පරිදි වෙනස් විය හැකි ආයතන නියෝජනය කරන නිලධාරීන්ගෙන්ද සමන්විය වේ.

කමිටුවේ ස්ථිර වශයෙන් සිටිය යුතු නියෝජිතයින් පහත සඳහන් වේ.

1. ප්‍රාදේශීය ලේකම් (හෝ ඔහුගේ නියෝජිතයකු)
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් නිලධාරී/ජනපද නිලධාරී/කෙෂ්ත්‍ර උපදේශක
3. අදාල ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී
4. පරිසර නිලධාරී
5. පළාත් ඉඩම් කොමසාරිස්ගේ නියෝජිතයකු/අන්තර් පළත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ නියෝජිතයකු
6. අදාල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි හෝ ඔහුගේ නියෝජිතයකු
7. අදාල පළාත් පාලන ආයතනයේ නියෝජිතයකු

ව්‍යාපෘතියේ ස්වභාවය අනුව අවස්ථානුකූලව අදාල වන කමිටුවේ අනෙකුත් නියෝජිතයින් පහත සඳහන්වේ.

1. නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයකු
2. ආයෝජන මණ්ඩලයේ නියෝජිතයකු
3. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයකු
4. සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ නියෝජිතයකු
5. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු
6. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු
7. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු
8. වනජීවි දෙපාර්තමේන්තුවේ නියෝජිතයෝකු

9. ජලජ ජීවී සම්පත් සංවර්ධන අධිකාරියේ නියෝජිතයකු
10. මධ්‍යම පරිසර අධිකාරියේ/අදාල පළාත් පරිසර අධිකාරියේ නියෝජිතයකු
11. සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නියෝජිතයකු
12. ව්‍යාපෘතියේ ස්වභාවය අනුව නිර්දේශ ලබාගැනීමට අවශ්‍ය විය හැකි වෙනත් රාජ්‍ය ආයතනවල නියෝජිතයින්

මෙම කමිටුවට අදාල වන ස්ථිර සාමාජිකයින් හැර අනෙකුත් සාමාජිකයින් සම්බන්ධ කර ගැනීමේදී අදාල ව්‍යාපෘතියේ ස්වභාවය අනුව අවශ්‍ය වන නිලධාරීන් පමණක් කැඳවීමට ප්‍රාදේශිය ලේකම් විසින් පියවර ගත යුතුයි.

පළාත් ඉඩම් කොමසාරිස්ගේ නියෝජිත විසින් කමිටුව සමඟ සම්බන්ධ වීමෙන් පළාත් සභාවේ එකඟතාවය ලබාදීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම අපේක්ෂා කෙරේ. ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී හෝ නියෝජිතයකු කමිටුවට සම්බන්ධ වීම තුලින් මූලික කටයුතු සඳහා අවශ්‍ය ඉඩමේ අනුරේඛනයක් සකස් කරවා ගැනීමත් රේඛා චිත්‍රය ලබාදීම සඳහා මූලික සූදානම් වීමත් අපේක්ෂා කෙරේ.

අදාල ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හෝ වනජීවී දෙපාර්තමේන්තුවේ පරිපාලනයට යටත්ව ඇති ඉඩම් වන්නේ නම් නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් එම ඉඩම් නිදහස් කිරීම පිළිබඳ තීරණය ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගෙන වාර්ථා කිරීම එම දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගෙන් මෙම කමිටුවට සම්බන්ධවීමෙන් සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාල වන ඉඩම් සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුවේ මෙවැනි ව්‍යාපෘතිවලට අනුමැතිය ලබාදීමේ කමිටුවට තීරණ ලබාදීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම මෙම කමිටුවට සම්බන්ධවීම තුලින් සිදු කෙරේ.

පළාත් සභාවල එකඟතාවය පරිසර සංවේදී ඉඩම් සම්බන්ධයෙන් වන විට මධ්‍යම පරිසර අධිකාරියේ හෝ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ නිර්දේශය, ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන විට ආයෝජන මණ්ඩලයේ අනුමැතිය හෝ නිර්දේශය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වනජීවී දෙපාර්තමේන්තුව සතු ඉඩමක් නම් එම දෙපාර්තමේතුවල එකඟතාවය අනිවාර්යයෙන් ලබාගත යුතුවේ. ඒ හැර අනෙකුත් සම්බන්ධිත ආයතනවල නිර්දේශයන් ඉල්ලා සිටිනු ලැබූ කාලය තුල (දැනුම් දෙන ලැබූ විශේෂිත හේතුවක් ඇත්තම් මිස) ලබා නොදෙන්නේ නම් හෝ ප්‍රාදේශිය ලේකම්ගේ ලිපිවලට නියමිත කාලය තුල කමිටුවට සහභාගී වීමෙන් වැලකී කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන්නේ නම් හෝ එම ආයතන විසින් එකඟතාවය හෝ නිර්දේශය ලබා දුන් සේ සලකා ප්‍රාදේශිය ලේකම් විසින් ක්‍රියා කළ යුතුයි. අදාල ආයතනවල නිලධාරීන්ගෙන් නිර්දේශ කැඳවීමේදී හෝ කමිටුවට කැඳවීමේදී එසේ ක්‍රියා කරන බව ප්‍රාදේශිය ලේකම් විසින් මුලින් දැන්විය යුතුය.

06. ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ වාර්තා එවීම :-

නිර්දේශ වාර්තා සකස් කිරීම සඳහා ප්‍රදේශිය ලේකම් විසින් නියමිත කමිටුව සම්බන්ධීකරණය කරමින් ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ පවත්වා නියමිත නිර්දේශ වාර්ථා අදාල ආයතනවලින් ලබාගෙන ප්‍රදේශිය ලේකම්ගේ නිර්දේශය සමඟ පළාත් ඉඩම් කොමසාරිස්ට සියලුම අමුණුම් පිටපත් සමඟ වාර්තාවේ පිටපතක් යවමින් මුල් පිටපත මා වෙත නියමිත කාලය තුල එවිය යුතුයි. පළාත් ඉඩම් කොමසාරිස් විසින් පළාත් සභාවේ එකඟතාවය මා වෙත වෙනම එවිය යුතු වේ.

නිර්දේශ වාර්ථා එවීමේදී ප්‍රාදේශිය ලේකම් විසින් පහත සඳහන් ලියකියවිලි මා වෙත එවිය යුතුයි. මෙම ලියවිලිවල අඩුපාඩු හේතුවෙන් නැවත නැවත නිවැරදි කිරීමට ගතවන අනවශ්‍ය ප්‍රමදය වළක්වා ගත යුතු හෙයින් මෙම ලියකියවිලි නිවැරදිවත් සම්පූර්ණවත් එකවර එවීමට වගබලා ගත යුතුයි.

නිර්දේශ වාර්තාව සමඟ එවිය යුතු ලියකියවිලි :-

1. 19 පරිශිෂ්ඨය
2. ඉඩමේ තත්ව වාර්තාව

3. 17 පරිශිෂ්ඨය
4. ඉඩමේ දල අනුරේඛණය
5. සමාගමක් නම් සංස්ථාපන සහතිකය
6. ව්‍යාපෘති වාර්තාව
7. කොටස් අයිතිය පිළිබඳ ලියවිලි (සමාගමක් නම්)

මෙම චක්‍රලේඛයේ සඳහන් ක්‍රියාපටිපාටිය සාමාන්‍ය පරිදි භෞතික ලියකියවිලි හුවමාරු කිරීමේ ක්‍රියාවලිය තුලින් සිදු කිරීමට අදාලව සකස් කර ඇති නමුත් e-slims වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රදේශිය ලේකම් කොට්ඨාශ මඟින් ක්‍රියා කිරීමේදී අදාල වැඩ පියවර සඳහා එම e-slims වැඩසටහනට අදාල වැඩපියවර අනුගමනය කළ යුතු බව සලකන්න.

07. මෙම චක්‍රලේඛයට අදාල ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් ඉහලම ප්‍රමුඛත්වය ලබාදී කඩිනමින් ඉඩම් ලබාදීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් අංශය යටතේ විශේෂ ආයෝජන ව්‍යාපෘති අංශයක් පිහිටුවා ඇත. එය භාර මණ්ඩලික නිලධාරියා වශයෙන් සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්) එස්.ඒ. කලානි එම්. ධනසේකර මිය අනුයුක්ත කර ඇත. එම ඒකකයේ සම්බන්ධතා විස්තර පහත සඳහන් වේ.


දුරකථන අංක :- 0112797427 , 0776499164

ෆැක්ස් අංක :-0112873110

ඊමේල් :-kalani.madara@gmail.com


මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී යම් ප්‍රායෝගික ගැටළු ඇත්නම් කරුණාකර අප්‍රමාදව මා අමතන්න.

ආර්.පී.ආර්.රාජපක්ෂ

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :-

| | |
|---|---|
| 01. ජනාධිපති ලේකම් | : කා.දැ.පි |
| 02. අග්‍රාමාත්‍ය ලේකම් | : කා.දැ.පි |
| 03. ලේකම්,ඉඩම් අමාත්‍යාංශය | : කා.දැ.පි |
| 04. ලේකම්,ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය | : කා.දැ.පි |
| 05. ලේකම් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | : කා.දැ.පි |
| 06. ලේකම්,ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | : කා.දැ.යි |
| 07. ලේකම්,කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | : කා.දැ.පි |
| 08. සියළුම පලාත් ප්‍රධාන ලේකම්වරුන් | : කා.දැ.පි |
| 09. මිණුම්පති | :සියළුම ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් දැනුවත් කිරීමට |
| 10. ප්‍රධාන තක්සේරුකරු | :අදාල නිලධාරින් දැණුවත් කිරීමට |

11. අධ්‍යක්ෂ ජනරාල් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව : කා.දැ.පි
12. රෙජිස්ට්‍රාර් ජනරාල් : දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් දැණුවත් කිරිමට
13. වන සංරක්ෂණ ජනරාල් :අ.ක.ස
14. වනජීවි අධ්‍යක්ෂ ජනරාල් : අ.ක.ස
15. සභාපති,නාගරික සංවර්ධන අධිකාරිය : අ.ක.ස
16. පුරාවිද්‍යා කොමසාරිස් ජනරාල් : අ.ක.ස
17. අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව : අ.ක.ස
18. සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය : අ.ක.ස
19. සභාපති, ආයෝජන මණ්ඩලය : අ.ක.ස
20. සභාපති, සංචාරක ප්‍රවර්ධන අධිකාරිය : අ.ක.ස
21. සභාපති, ජලජ ජීවි සම්පත් සංවර්ධන අධිකාරිය : අ.ක.ස
22. අධ්‍යක්ෂ ජනරාල්, සුනිත්‍ය බලශක්ති අධිකාරිය : අ.ක.ස
23. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු : අ.ක.ස
24. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් : අ.ක.ස